# පසන් නිවස

ඉදිරිපත් කරන්නේ
ගීතා යටවර



## රටඉඳි කේක්

ඇට ඉවත් කරගත් රටඉඳි ග්‍රෑම් 500
කහට තේ වතුර කෝප්ප 1
සෝඩා කාබනේට් තේ හැඳි 1
බටර් ග්‍රෑම් 150
සීනි ග්‍රෑම් 250
පිටි (සෙල්ෆ් රේසින්) ග්‍රෑම් 250
කජු මද ග්‍රෑම් 100 පමණ
බිත්තර 2

පළමුව තේ වතුර කෝප්පයට සෝඩා කාබනේට් තේ හැඳි 1 සහ හීනියට කපා ගත් රටඉඳි මිශ්‍ර කර පැය 3 පමණ තබා ගන්න. ඉන්පසු සීනි, බටර්, සහ බිත්තර හොඳහැටි ගසා (බීට්කර) ගන්න. එම මිශ්‍රණයට කලින් සාදාගත් රටඉඳි මිශ්‍රනය ද , කජු සහ පිටි ද එක්කර හොඳින් කලවම් කර බේක් කරගන්න.



# මුළුතැන්ගේ



## සිල්වබීට් කොළ කැඳ

සිල්වබීට් ලොකු කොළ 4 පමණ
උකු පොල්කිරි කෝප්ප කාලක් (1/4) පමණ
හාල් කෝප්ප 1
ලුණු අවශ්‍ය ප්‍රමාණයට

වතුර කෝප්ප තුනක් එක්කර හාල් හොඳහැටි තම්බාගන්න. සිල්වබීට් කොළ වලට වතුර කෝප්ප තුනක් දමා, බ්ලෙන්ඩර් කර පෙරා රොඩු ටික ඉවත්කරගන්න. ඉන්පසු බත් ද බ්ලෙන්ඩර් කර කලින් බ්ලෙන්ඩර් කර සාදාගත් සිල්වබීට් යුෂ සමග මුසු කරගන්න. අවශ්‍ය ප්‍රමාණයට ලුණු එකතු කර ලිපේ තබා නටන විටදී ලිපෙන් ඉවත්කරගන්න.




**වැඩි පිරිසක් අතරට ඔබේ දැන්වීම ගෙනයන්න**
සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න
03 8707 4604 - 0402 025 516
**email** sannasanews@gmail.com / ads.sannasa@gmail.com

